*සැ. යු.-* 2017.01.13 දින පළ වූ අංක 2002 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,005 - 2017 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2017.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 184 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 162 |

*සැ. යු.* -(i) කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 පෙබරවාරි මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

බඳවා ගැනීම්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පරිපාලන නිලධාරී හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පොදු සුදුසුකම් :

(i) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා උපරිම වයස් සීමාව අදළ නොවේ)
(iv) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි

මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයක් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03. තනතුරට අදාළ තොරතුරු

| | |
|---|---|
| 1 තනතුරු නාමය<br>1.1 වැටුප් පරිමාණය<br>1.2 සුදුසුකම් | පරිපාලන නිලධාරී - (II ශ්‍රේණිය)<br>JM-1-1-2016 (රු.42,600-10x755-18x1,135-රු. 70,580/-<br>(i) පිළිගත් විශ්වවිද්‍යාලයක කළමණාකරණය, ගණකාධිකරණය හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.<br>(ii) අදළ ක්ෂේත්‍රයක වසර 03 ක පළපුරුද්ද (ආයතන කටයුතු හා මූල්‍ය කටයුතු) සහ<br>(iii) පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ (විශේෂයෙන් මූල්‍ය කටයුතු සම්බන්ධව) ඇති හැකියාව විශේෂ සුදුසුකමක් වේ.<br>(iv) දෙවන භාෂාවකින් කටයුතු කිරීමට ඇති හැකියාව තිබිය යුතුය.<br>(v) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ උසස් දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත. |
| 2 තනතුරු නාමය<br>2.1 වැටුප් පරිමාණය<br>2.2 සුදුසුකම් | කළමනාකරණ සහකාර - (III ශ්‍රේණිය)<br>MA-1-1-2016 (රු.27,910-10x300-7x350-4x495-20x660-රු. 48,540<br>(i) සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.<br>(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.<br>(iii) පරිගණක භාවිතය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් රජයේ හෝ කාර්මික හා තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් ආයතනයකින් ලබා තිබීම. |
| | විශේෂිත සුදුසුකම් :<br>(i) ගණකාධිකරණය පිළිබඳව එක් අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් රජය පිළිගත් ආයතනයකින් හදරා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ. (ගිණුම් අංශය සඳහා) |

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.02.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තු වලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් අදාළ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව සලකා බැලේ.

***සැලකිය යුතුයි.*** - ආයතනය දැනට අංක 126 නාවල පාර, නුගේගොඩ යන ස්ථානයේ ස්ථාපනය කර ඇති අතර ශාඛා කාර්යාලය නොමැත.

මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළකර ඇත. භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක,
සභාපති,
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

අංක 126,
නාවල පාර,
නුගේගොඩ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ.......................................................................................................................
තනතුර සඳහා අයදුම් පත්‍රය

(01) 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
1.2 මුලකුරු සමග නම :————.

(02) ස්ථිර ලිපිනය :————.
(03) දුරකථන අංකය :————.
(04) ජාතික හැඳුනුම්පත් අංකය :————.
(05) 5.1 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
5.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : වර්ෂ :————. මාස :————. දින :————.
(06) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(07) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :————.
(08) අධ්‍යාපන සුදුසුකම් :
8.1 උපාධියේ නම (අදාළ වේනම්) :————.
උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය :————.
උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය :————.
උපාධි විෂයයන් :————.
උපාධිය බාහිර/අභ්‍යන්තර ද යන වග :————.

8.2 අ.පො.ස. (උ. පෙළ) ප්‍රතිඵල

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

8.3 අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(09) වෙනත් සුදුසුකම් :

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(10) වෘත්තීය සුදුසුකම් :

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(11) සේවා පළපුරුද්ද :

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(12) මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

(13) දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ............ ........................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

————,
අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.

02-123

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික ශිෂ්‍යභට නිලධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිලධාරීන් සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි/කාන්තා)
(ආ) කාර්මික ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඇ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඈ) උපකරණ ශාඛාව (පිරිමි/කාන්තා)
(ඉ) පරිපාලන ශාඛාව (පිරිමි/කාන්තා)
(ඊ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (පිරිමි)
(උ) මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි)

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. :-

*BSc. (Aviation Studies)* උපාධි වැඩසටහන් යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිළිගත්) :

නියමු පොදු රාජකාරි/මෙහෙයුම් ගුවන් ශාඛාවන් (ගුවන් ගමන් පාලක) :

අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතුයි. තව ද අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී භෞතික විද්‍යා විෂය ධාරාව (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය)/ජීව විද්‍යා විෂය ධාරාව (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව) යන විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

කාර්මික ඉංජිනේරු/විද්‍යුත් ඉංජිනේරු ශාඛාවන් :

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටිය යුතුයි. තව ද අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරක දී භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

උපකරණ/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු ශාඛාවන් :

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 4ක් සහිතව විෂයයන් 6කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතුයි. තවද අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරකදී භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/තාක්ෂණවේදය යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. කලා විෂය ධාරාවෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා ඇති අයදුම්කරුවන්හට ඉල්ලුම්කළ හැක්කේ පරිපාලන රෙජිමේන්තු ශාඛාවට පමණි.

3. අනෙකුත් සුදුසුකම්.—අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යෙන්ම සපුරාලිය යුතුයි. :

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි; |
| (ආ) | වයස : | 2017 මැයි මස 20 දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි; |
| (ඇ) | උස : | පිරිමි - අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි;<br>කාන්තා - අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි; |
| (ඈ) | බර : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25<br>ශරීර ස්කන්ධ දර්ශකය = බර (කි. ග්‍රෑ.) / උස $^2$ (මී) |
| (ඉ) | පපුව : | පිරිමි - අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිය : | සීපී 2 |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත) |
| (ඌ) | සිවිල් තත්ත්වය : | අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. |

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

6. සේවා කොන්දේසි :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිලයන් හා සමානව,මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු, ඔහු/ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිලයෙන් වෙනස්ව නියමු නිලධාරි නිලයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයකුට ම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයන් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ  නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිවයුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම්, එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 27 වැනි කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) දෙවැනි සහ තෙවැනි ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. නිලධාරි තත්ත්ව පරීක්ෂාවෙන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට (ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ) සුදුසුකම් ලබයි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරීන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අයකරනු ලැබේ.

(ඕ) සියලුම නිලධාරීන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරීන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. වැටුප් හා දීමනා :

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිලධාරීන්ගේ සහ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ :-

| වර්ෂය<br>නිලය | 2017<br>(වසරකට) | සංශෝධිත<br>දීමනාව<br>2017<br>(වසරකට) | 2020<br>(වසරකට) |
|---|---|---|---|
| ඔෆිසර් කැඩේට් | 2,67,996.00 | 77,148.00 | 3,88,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍යභට) | 3,19,404.00 | 68,796.00 | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට නොවන) | 3,46,764.00 | 64,476.00 | 5,02,860.00 |
| ප්ලයින් ඔෆිසර් | 3,93,684.00 | 56,580.00 | 5,71,380.00<br>(30 x 16020)<br>= 10,51,980.00 |
| ප්ලයිට් ලෙප්ටිනන් | 4,59,996.00 | 45,996.00 | 6,67,500.00<br>-(24 x 16020)<br>= 10,51,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 5,04,204.00 | 38,940.00 | 7,31,580.00 -<br>(22x 16020)<br>- 10,84,020.00 |

(ආ) අනෙකුත් දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.)

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 16,676.14 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

(11) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කාලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(12) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(13) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(14) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයින්ට) සපයනු ලැබේ.

(15) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන් හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීමට බලපත්‍රයක් දෙනු ලැබේ.

(16) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.

(17) ඉංජිනේරු දීමනාව ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරීන්හට පමණි.

(18) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෑප් කැප්ටන් සහ ඉන් ඉහල නිලයන්ට මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා වේ.

09. විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා.—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/ පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරීන් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයින් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

10. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2017 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00 ට ප්‍රථම ලැබෙන සේ “විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ “ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත ......... ශාඛාව ” යනුවෙන් සටහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් ශාඛාවකට පමණක් ඉල්ලුම් කළ යුතු අතර, ශාඛාවන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. :—

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය වලංගු නොවේ.),

(2) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය,

(5) ක්‍රීඩා හා ශිෂ්‍ය භට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරාගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව හා ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

කේවීබී ජයම්පති,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පැ. 594
කොළඹ 02.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිළධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදවේ . . . . . . . ශාඛාව**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.
වයස : (2017 මැයි මස 20 දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : අඩි :———— අඟල් :————.

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

9. දිස්ත්‍රික්කය :————.

10. ඡන්ද කොට්ඨාසය :————.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

12. දුරකථන අංකය :————.

13. විවාහක හෝ අවිවාහක බව :————.

14. ස්ත්‍රී පුරුෂ භාවය :————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :————.

16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) : | | |
| | අ.පො.ස. (උ.පෙළ) : | | |
| | වෙනත් : | | |

17. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැනට ලිපිනය* |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :—————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :—————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :—————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :—————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

28. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(*අ*) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ……..................…. නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි. :

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම;

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

—————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :—————.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

—————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

—————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

* අදාළ නොවන වචන කපා හරින්න.

02-191

## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පහත සඳහන් තනතුරු සඳහා පහත දක්වෙන සුදුසුකම් සපුරා ඇති අදළ පළාත තුල පදිංචි විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පළාත් අධ්‍යක්ෂ - බස්නාහිර පළාත - තනතුරු 01
02. පළාත් අධ්‍යක්ෂ - දකුණු පළාත - තනතුරු 01
03. පළාත් අධ්‍යක්ෂ - සබරගමුව පළාත - තනතුරු 01

දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරක සේවය කර විශ්‍රාම ලබා ඇති 2017.02.22 දිනට වයස අවුරුදු 66 නොඉක්මවූ නිලධාරියෙකු විය යුතුය.

(i) සම්බන්ධීකරණ හා විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

(ii) තෝරාගනු ලබන නිලධාරීන් සඳහා සියළු දීමනා ඇතුලත්ව රු. 40,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(iii) වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

මේ අනුව ඉහත පරිදි සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් තම ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත් 2017.02.22 දින හෝ ඊට පෙර ලේකම් ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 9 ගොඩනැගිල්ල, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

එන්. ආරියදස කුරේ,
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

02-03

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2017
### 2017 / 2019 අධ්‍යයන වර්ෂය සඳහා සත්ත්ව පාලන දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන දැවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාවේ 2017 / 2019 අධ්‍යයන වර්ෂය සඳහා කරඳගොල්ල හා සීප්පුකුලම ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාල වලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් 2017 මාර්තු මස මහනුවරදී පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව :

2.1 මෙම පාඨමාලාව පූර්ණ ලෙස සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

2.2 මෙම පුහුණුව හුදෙක්ම වෘත්තිමය සුදුසුකම් ලබා දීමක් පමණක් වේ. (රජයේ රැකියාවක් ලබාගැනීම සඳහා මෙම වෘත්තීය සුදුසුකමට අමතරව, එම තනතුරට අදළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබීම අත්‍යාවශ්‍ය වේ.)

2.3 පාඨමාලාව හදරන කාලය තුලදී සිසුන්ට දෛනිකව නේවාසික දීමනාවක් ලබාදෙන අතර, අමතරව අවශ්‍ය වන මුදල් සිසුන් විසින් සපයා ගතයුතුය.

2.4 සෙනසුරාද හා ඉරිද යන දින වලද ඇතැම්විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාර වලින් බැහැරව යවන්නේ මසකට එන් සති අන්තයකදී පමණි.

03. ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :

3.1 (අ) සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට සම්මාන සාමාර්ථද, තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සහිතව අ. පො. ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට

සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබීම.

සහ

අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදරා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් තුනක් එක්වර සමත් වී තිබීම. (මෙම සුදුසුකම ඇති සිසුන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.)

හෝ

(ආ) සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට සම්මාන සාමාර්ථද, තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සහිතව අ. පො. ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබීම.

සහ

අ. පො. ස.(උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදරා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යා යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වී තිබීම. මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ 3.1(අ) හි අයදුම්කරුවන් සියළුමදෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි.

3.2 2017 පෙබරවාරි 28 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවු. 17 ට නොඅඩු විය යුතු අතර, අවු. 25 ට වැඩි නොවිය යුතුය.

3.3 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා / හෝ නියමිත වයස් සීමාවෙන් බැහැරවන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවන් අයදුම්පත් එවීම නොකළ යුතුය. රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දැවුරුදු සත්ත්ව පාලන පාඨමාලාවක් හදරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

04. අයදුම්පත්

4.1 මෙම දන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් පිළියෙල කරගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 විභාග ගාස්තුව රු. 150/- කි. අපේක්ෂකයා විසින් එම මුදල හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ගේ පේරාදෙණිය, මහජන බැංකුවේ ගිණුම් අංක 057100179027275 වෙත බැර කරන ලද රිසිට්පතේ මුල් පිටපත අයදුම්පත්‍රයත් සමග අමුණා එවිය යුතුය. රිසිට්පතේ දරය පමණක් ඇලවිය යුතුය. තවද රිසිට්පතේ ඡායා පිටපතක් ලඟ තබාගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වන බැංකු රිසිට්පත අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම්දීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියළුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2017.02.28 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙනසේ අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය.

4.4 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2017/2019 සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම" යන්න සඳහන් කරන්න.

4.5 අයදුම්පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය. ඉල්ලා ඇති සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියළුම සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

05. බඳවා ගැනීම :

5.1 පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5.2 ලිඛිත පරීක්ෂණය සඳහා වූ විෂයය නිර්දේශය පහත පරිදි වේ. :-

(i) සත්ත්ව පාලනය - අ.පො.ස. (සාමාන්‍ය පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස් කරන බහුවර්ණ කෙටි ප්‍රශ්න අඩංගු වේ. - කාලය පැය 01 යි.

(ii) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි.

5.3 ලිඛිත පරීක්ෂණය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම/ හෝ පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මගින් ගෙවනු නොලැබේ.

5.4 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත සනාථකර සිටිය යුතුය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලි වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

5.5 යම් අයදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බව තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔහුගේ/ ඇයගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටුවනු ලැබීමට යටත්වනු ඇත. එලෙසම පුහුණු පාඨමාලාව ආරම්භ කර මසකට පසු ඉවත්ව යන සිසුන් පුහුණුව සඳහා රජය මගින් ඒ වන විට දරා ඇති සියළු වියදම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට බැඳී සිටින්නේ ය. වියදම් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවන්නේ ය.

06 සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු / විශ්‍රාම ප්‍රධානියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාර වරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

07. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

වෛද්‍ය ඒ. සිවසෝති,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2017 ජනවාරි මස 13 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

ඉල්ලුම් පත්‍රය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය
සත්ත්ව පාලන දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (2017/2019)

විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය : [ ]

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමග නම :———.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. ලිපිනය :————.

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

දිස්ත්‍රික්කය :————.

06. උපන් දිනය :
අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

07. 2017.02.28 වැනි දිනට වයස :

අවුරුදු :———. මාස :———. දින :———.

08. දුරකථන අංකය :————.

09. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය

| *විෂයයන්* | *සාමාන්‍ය/ සම්මාන/විශිෂ්ඨ* | *වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09 | | | |
| 10. | | | |

(ii) අ.පො.ස (උසස් පෙළ) විභාගය

| විෂයයන් | සාමාන්‍ය/ සම්මාන/ විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.)

10. මුදල් ගෙවූ බැංකු රිසිට්පත් අංකය :————.

(බැංකු රිසිට්පත ගලවා ගත හැකිවන පරිදි අමුණන්න)

11. අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසල් / ආයතනය :————.

12. පාසලෙන් / ආයතනයෙන් අස්වූ දිනය :————.

13. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
(සහතික පිටපත් ඇමිණිය යුතුය. )

14. ග්‍රාම සංවර්ධන/කෘෂිකාර්මික/සමාජසේවා/ක්‍රීඩා පළපුරුද්ද :

(සහතික පිටපත් ඇමිණිය යුතුය. )

15. අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
1. ————.
2. ————.

ඉහත දැක්වෙන විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍යවූ ද, නිවැරදි වූ තොරතුරු බව මගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර , යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරක් හෙළිදරව් වුවහොත්, මගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බව ද, පුහුණුව ලබන කාලයේ දී මා වෙනුවෙන් රජයට යම් මුදලක් ගෙවීමට සිදුවී නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන.—මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන

1. ————.
2. ————.

අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................මහතා/ මහත්මිය/මෙනවිය මා ඉතා හොඳින් හඳුනමි. නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ඉහත අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(කරුණාකර නිලමුද්‍රාව තබන්න)

02-23

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල - 2017

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන 2017 රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල සඳහා අයදුම්පත් භාරගැනීම 2017 ජනවාරි මස 20 වැනි දින සිට මාර්තු මස 10 වැනි දින දක්වා සිදුකෙරේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග චිත්‍ර නිර්මාණයක් නම් එම නිර්මාණයේ පැහැදිලි ඡායා රූප 02 ක්, මූර්ති සහ ස්ථාපන නිර්මාණ නම් ඉදිරිපස සහ දෙපසින් ගත් ඡායාරූප 03 ක් සහ පාස්පෝට් ප්‍රමාණයේ ඔබගේ ඡායාරූපයක් සමග එම ඡායාරූප ඇතුළත් කරන ලද සංයුක්ත තැටියක් අධ්‍යක්ෂක, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. (ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ''රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල - 2017 ලෙස සඳහන් විය යුතුය.) ඔබ විසින් එවනු ලබන නිර්මාණ ප්‍රවීණ විනිසුරු

මඩුල්ලක් මගින් විනිශ්චය කිරීමෙන් අනතුරුව තෝරාගනු ලැබූ නිර්මාණ වල මුල් කෘතිය අප විසින් දනුම් දෙනු ලබන දිනයක් තුළ අදාළ ස්ථානයට ගෙනවිත් භාරදිය යුතු වේ. තෝරාගනු ලබන සියලුම නිර්මාණ 2017 රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙලේ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන අතර, එම නිර්මාණ සඳහා සහතිකපත්‍රයක් සහ ජයග්‍රාහකයන්ට සම්මාන, සහතික සහ ත්‍යාග ප්‍රදනය සිදු කෙරේ.

තරග අංශ :

- චිත්‍ර
  1. ආලේඛ්‍ය
  2. භූමි දර්ශන
  3. නිර්මාණාත්මක සම්පිණ්ඩන
  4. සම්ප්‍රදයක චිත්‍ර පිටපත් කිරීම (සිතුවම් පිටපත් කළ ස්ථානය පිළිබඳව කෙටි විස්තරයක් හා මුල් නිර්මාණයේ ඡායා රූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- මූර්ති
  1. ආලේඛ්‍ය
  2. නිර්මාණාත්මක සම්පිණ්ඩන
  3. සාම්ප්‍රදයික මූර්ති

  (ඕනෑම ස්ථිර මාධ්‍යයක් භාවිතා කළ හැකිය)

- ස්ථාපන
  (ලබාදිය හැකි උපරිම ඉඩ ප්‍රමාණය අඩි 8x8x8 (උස, දිග, පළල) වේ.)

- මුද්‍රණ විධි

තරග කොන්දේසි :

1. මෙය වයස අවුරුදු 18ට වැඩි විවෘත තරගයකි.
2. ඔබ කැමති ඕනෑම මාතෘකාවක් තේමා කර ගත හැකිය.
3. ඔබ කැමති ඕනෑම ස්ථිර මාධ්‍යයක් භාවිතා කළ හැක.
4. තරග අංශයන්ගෙන් ඔබ කැමති ඕනෑම අංශයක් හෝ අංශ කිහිපයක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැක.
5. එක් අංශයකින් එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකිය.
6. ස්ථාපන යටතේ ඉදිරිපත් කරන නිර්මාණවල උපරිම ප්‍රමාණය උස - අඩි 8, පළල - අඩි 8, දිග-අඩි 8 ක් විය යුතුය.
7. අයදුම්පත්‍රයේ තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි බසින් නිවැරදිව පැහැදිලි අකුරින් සඳහන් කළ යුතුය. මෙම තොරතුරු නිවැරදි සහ පැහැදිලි නොවන්නේ නම් තරගයෙන් ඉවත් කරනු ලැබේ.
8. සංයුක්ත තැටියේ සහ ඡායාරූප පිටුපස නම, ලිපිනය. අත්සන පැහැදිලිව සඳහන් කළ යුතුය.
9. ඔබ විසින් එවනු ලබන නිර්මාණයේ ඡායාරූප සහ එම ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටිය නැවත භාරදෙනු නොලැබේ.
10. පළමු වටයේ දී ඔබ විසින් එවනු ලබන නිර්මාණයේ ඡායාරූප ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් වෙත ඉදිරිපත් කර, එයින් තෝරාගන්නා නිර්මාණ පමණක් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. එම නිර්මාණ නැවත ඔබ වෙත ලබාදෙනු ඇත.
11. ප්‍රදර්ශනයෙන් පසු දිනම ප්‍රදර්ශන ශාලාවෙන් ඔබගේ නිර්මාණ ඉවත් කරගත යුතු අතර, ඉවත් කර නොගන්නා නිර්මාණ සඳහා අප දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

විමසීම් :- 011 2882551/011 2872031
වැඩි විස්තර සහ අයදුම් පත්‍රය www.culturaldept.gov.lk වෙබ් පිටුවට පිවිසීමෙන් ලබාගත හැක.

රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල - 2017

අයදුම් පත්‍රය

සම්පූර්ණ නම :

සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

මුලකුරු සමග නම :

දුරකථන : නිවස : ජංගම :

E - mail ලිපිනය :

ස්ථිර ලිපිනය :

උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

ජාතික හඳුනුම්පත් අංකය :

තරඟ අංශ (✓)

| | |
|---|---|
| ➢ චිත්‍ර<br>☐ ආලේඛ්‍ය<br>☐ භූමි දර්ශන<br>☐ නිර්මාණාත්මක සම්පිණ්ඩන<br>☐ සාම්ප්‍රදායික චිත්‍ර පිටපත් කිරීම<br>(සිතුවම් පිටපත් කළ ස්ථානය පිළිබඳව කෙටි විස්තරයක් හා මුල් නිර්මාණයේ ඡායා රූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.) | ➢ මූර්ති<br>☐ ආලේඛ්‍ය<br>☐ නිර්මාණාත්මක සම්පිණ්ඩන<br>☐ සාම්ප්‍රදායික මූර්ති<br>(ඕනෑම ස්ථිර මාධ්‍යක් භාවිතා කළ හැක.) |

| | |
|---|---|
| ☐ ස්ථාපන (ලබාදිය හැකි උපරිම ඉඩ ප්‍රමාණය අඩි 8x8x8 (උස,දිග,පළල) වේ). | ☐ මුද්‍රණ විධි |

නිර්මාණයේ මාතෘකාව : ☐

නිර්මාණයේ ප්‍රමාණය : උස : ☐☐ දිග : ☐☐ පළල : ☐☐

ප්‍රදර්ශනය කරන ආකාරය (✓) : ☐ මේසයක් මත ☐ බිත්තිය මත එල්ලීම ☐ පොළව මත ☐ වෙනත් (..........................................)

නිර්මාණයේ වටිනාකම : රු.

ඉහත මා විසින් ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු සත්‍ය හා වඩාත් නිවැරදි බවත්, මෙහි ඇතුළත් සියලු කොන්දේසිවලට එකඟ වන බවත් සහතික කරමි.

දිනය :- .............................. අත්සන : ..............................

02-104/1

---

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2017

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන ''2017 - රාජ්‍ය ළමා චිත්‍ර උළෙල'' සඳහා නිර්මාණ භාර ගැනීම 2017 ජනවාරි මස 20 වැනි දින සිට මාර්තු මස 10 වැනි දින දක්වා කොළඹ 07 ජාතික කලාභවනේදී සිදුකෙරේ. එසේ ලැබෙන චිත්‍ර අතරින් එක් දිස්ත්‍රික්කයකින් නිර්මාණ 50 බැගින් තෝරා එම නිර්මාණකරුවන් දෙවන වටයේ තරගය සඳහා යොමුකෙරේ. දෙවන වටයේ තරග පළාත් මට්ටමින් විශේෂ වැඩමුළුවක්ද සහිතව පැවැත්වීමට කටයුතු සංවිධානය කරන අතර පළමු වටයේ ජයග්‍රාහකයන් සියලු දෙනා වෙත එදින සහතික පත්‍රයක් ද ලබා දීමට කටයුතු කෙරේ. දෙවන වටයේදී අඳිනු ලබන චිත්‍ර අතරින් තෝරාගන්නා නිර්මාණ ''2017 - රාජ්‍ය ළමා චිත්‍ර උළෙල'' සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. එහි දී ජයග්‍රහණය කරන ළමා සිත්තරුන් වෙත රාජ්‍ය ළමා චිත්‍ර උළෙලේදී ත්‍යාග, සම්මාන හා සහතික පත් ප්‍රදානය කෙරෙනු ඇත.

තරග අංශ :

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රාථමික අංශය | වයස අවුරුදු | 05 - 06 |
| 2. | පශ්චාත් ප්‍රාථමික අංශය | වයස අවුරුදු | 07 - 09 |
| 3. | කනිෂ්ඨ අංශය | වයස අවුරුදු | 10 - 12 |
| 4. | ජ්‍යෙෂ්ඨ අංශය | වයස අවුරුදු | 13 - 15 |
| 5. | ජ්‍යෙෂ්ඨ ද්විතීක අංශය | වයස අවුරුදු | 16 - 18 |

තරග කොන්දේසි :

1. ඔබ කැමති ඕනෑම තේමාවක් සිතුවමට නැගිය හැකිය.
2. ඔබ කැමති ඕනෑම මාධ්‍යයක් චිත්‍ර ඇඳීමට භාවිතා කළ හැකිය.
3. චිත්‍රය අඟල් 18 x 14 ප්‍රමාණය විය යුතුය.
4. එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
5. එවනු ලබන නිර්මාණය මීට පෙර වෙනත් තරගයකට ඉදිරිපත් නොකළ එකක් විය යුතුය.
6. චිත්‍රය ඉදිරිපත් කළ හැක්කේ ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් පමණි.
7. ඔබ විසින් එවනු ලබන නිර්මාණ ප්‍රවීණ විනිසුරු මණ්ඩලයකට ඉදිරිපත් කර එයින් තෝරාගන්නා ළමුන් පමණක් අදාළ දිස්ත්‍රික් තරගය සඳහා තෝරාගන්නා අතර තරග පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය පසුව දැනුම්දෙනු ඇත.
8. චිත්‍රයේ පිටුපස පහත තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි බසින් නිවැරදිව, පැහැදිලි අත් අකුරින් සඳහන් කළ යුතුය. මෙම තොරතුරු නිවැරදිව සඳහන් නොවන නිර්මාණ තරගයෙන් ඉවත් කෙරෙනු ඇත. ඔබ විසින් එවනු ලබන චිත්‍ර නිර්මාණය නැවත භාරදෙනු නොලැබේ.
   (තොරතුරු වෙනම පත්‍රිකාවක සටහන් කර අලවන්නේ නම් නොගැලවෙන සේ ඇලවිය යුතුය.)
9. මේ පිළිබඳ වැඩි විස්තර ඔබ පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරීන් මගින් ලබාගත හැක.

- සම්පූර්ණ නම :————.
- මුලකුරු සමග නම :————.
- උපන් දිනය :————.
- 2016.12.31 දිනට වයස :————.
- තරග අංශය :————.
- පෞද්ගලික ලිපිනය :————.
- ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
- දුරකථන අංකය :————.

පසු පිටේ ඇති නිර්මාණය මගේම බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

චිත්‍ර නිර්මාණ එවිය යුතු ලිපිනය :

ජාතික සම්බන්ධීකාරක,
රාජ්‍ය දෘශ්‍ය කලා උපදේශක මණ්ඩලය,
ජාතික කලා භවන,
ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 07.

චිත්‍ර එවනු ලබන ලියුම් කවරයේ හෝ පාර්සලයේ ඉහළ වම් කෙළවරේ ''රාජ්‍ය ළමා චිත්‍ර තරගය - 2017'' ලෙස සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

විමසීම් : 0112882551/0112872031

වැඩි විස්තර සඳහා www.culturaldept.gov.lk වෙබ් පිටුවට පිවිසීමෙන් ලබාගත හැක.

02-104/2

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තුමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) තනතුරෙහි පුරප්පාඩු 01 ක් සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී / පුරුෂ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයකු තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) පුරප්පාඩුව සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

02. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

| තනතුර | තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | I. භෞතික විද්‍යාව/රසායන විද්‍යාව අතුළත්ව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම සහ<br>II. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම. |
| වෘත්තීය සුදුසුකම් | මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>හෝ<br>ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු (සිවිල් ඉංජිනේරු) ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

03. *කායික සුදුසුකම් :*
සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

04. *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනය/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. *වයස* : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

07. *බඳවා ගැනීමේ ලිඛිත විභාගය* : මෙම විභාගය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් කොළඹ නගරයේ දී පමණක් පැවැත් වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානු- -කූලත්වයත් සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |
| පොදු පරීක්ෂණය (විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය) | තනතුරට අදාළව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විතය. | පැය 01 | 100 | 40 |

08. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලබන අතර ඒ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

09. *වැටුප් පරිමාණය* :

රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

බඳවා ගනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි.
පත් කරනු ලබන තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
මෙම පත්වීම ලබන පුද්ගලයා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුයි.

11. මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පතට අනුව 1 සිට 05 දක්වා පළමු පිටුවට ද අනෙක් කොටස් දෙවන හා තුන්වන පිටුවට ද ඇතුළත් වන සේ A4 ප්‍රමාණයේ කොළයක දෙපසම භාවිතයට ගනිමින් අයදුම්පත්‍රය සැකසිය යුතු ය. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත් සකස් කළ යුතු ය. මෙම නිවේදනයේ නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

13. සුදුසුකම් ලැබූවන් විභාගයට කැඳවනු ලබන අතර ඒ බව සති දෙකකට ප්‍රථම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

I. තැපෑලෙන් නැතිවීම හෝ සිදු වූ ප්‍රමාද, සඳහා වන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

II. "රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05" යන ලිපිනයට හැර වෙනත් ලිපිනයකට එවනු ලබන අයදුම්පත්‍ර සඳහා වන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

III. රජයේ සේවයේ සිටින අය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. තෝරාගනු ලබන විට දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට එකඟ බව සඳහන් කල යුතුයි.

IV. ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

V. විභාගයට ප්‍රවේශපත්‍ර එවීම ඔබගේ සුදුසුකම් සනාථ කළ බවට සැලකිල්ලට නොගත යුතුය.

14. මෙම විභාගයට පෙනී සිටීමට දින 07 කට ප්‍රථමයෙන් ප්‍රවේශපත්‍ර නොලැබී තිබේ නම් පහත සඳහන් විස්තර වලට අනුව "රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05" ලිපිනයට දැන්විය යුතුය. (දුරකථන අංකය : 011-2514266, ෆැක්ස් අංකය : 011-2514092)

- ඉල්ලුම් කිරීමේ ලිපිනය
- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්පතේ ඡායා පිටපත
- ඉල්ලුම්පත් තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලියාපදිංචි අංකය හා දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් එහි ඡායා පිටපත
- ප්‍රවේශපත් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය

15. *අයදුම්කළ යුතු ක්‍රමය* :

(*අ*) අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "තාක්ෂණ නිලධාරී (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017" යනුවෙන් සඳහන් කර 2017/03/03 වැනි දිනට පෙර "රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.03.03 වේ.

(*ඇ*) "රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05" යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 1000.00 ක විභාග ගාස්තුවක් සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුයි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

16. *අත්සන සහතික කිරීම* :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ / අධ්‍යාපන පරිපාලන සේවයේ / රජයේ ගණකාධිකාරී සේවයේ / රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතිඥවරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන සහතික කර ගත යුතුයි.

සැලකිය යුතුයි :

- අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳව සහතික විය යුතුයි.

- සුදුසුකම්වලට අදාළ සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුයි.

- ඉහත පරිදි බඳවාගන්නා ලද සියළුම දෙනා රජයේ සේවකයන්ට අදාළ වන සියළුම නීති රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටියක රිතීන්ට, ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසි වලටද රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

- පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ කිරීමේ සම්පූර්ණ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

- තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම මෙහි සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ආචාර්ය රංග කලන්සූරිය,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2017 ජනවාරි මස 13 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත, කොළඹ දීය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තාක්ෂණ නිලධාරි (ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

ඉල්ලුම් කරන අංශය : [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 01
දෙමළ - 02 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./Mrs./Miss. :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: Mr./Mrs./Miss. SILVA A.B

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

03. 3.1 උපන් දිනය :————.

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂභාවය :————.

06. අධ්‍යාපන සුදුසුකම් ඃ

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

07. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් ඃ

7.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.
7.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනය :————.
7.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

08. වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :————.

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. රු. 1,000 0 |
|---|

10. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………… මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

02-88

---

## තැපැල් දෙපාර්තමේන්තුව

### තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියැදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

### Open Competitive Examination for Recruitment to the Post of Postal service Driver Grade III in the Employee Category of Primary Level Skilled of the Department of Posts - 2017

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියැදුරු තනතුරු පුරප්පාඩු 13ක් සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අංක 01 හි දක්වා ඇති නගර වල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් 2017 මැයි මාසයේ දී විභාගය පැවැත්වේ. විභාගයට පෙනී සිටීම සඳහා අයදුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

1. විභාග මධ්‍යස්ථාන

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| යාපනය | 03 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කර නොමැති අවස්ථාවන්හි දී එම අයදුම්කරුවන්ට ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක දී හෝ නැති නම් කොළඹ දී පමණක් විභාගය පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ.

2. භාෂා මාධ්‍ය :
විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3. බඳවා ගැනීමේ සුදුසුකම් :

3.1 *අධ්‍යාපන සුදුසුකම්.*—අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

3.2 *වෘත්තීය සුදුසුකම්.*—මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම.

3.3 *පළපුරුද්ද.*— D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසුව 2017.03.02 දිනට පෙර D පන්තියේ බර වාහන පැදවීම පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී සහතික මගින් සනාථ කළ යුතුවේ.)

3.4 කායික සුදුසුකම් :-

(i) අයදුම්කරුගේ අවම උස අඩි 5 අඟල් 2 1/2 කට (සෙ. මී. 157) නොඅඩු විය යුතුය.

(ii) සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියැදුරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.)

3.5 වෙනත් :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත වන බව ග්‍රාම නිලධාරි විසින් සනාථ කළ යුතුය.

(iii) පුරුෂ පාර්ශවය පමණක් අයදුම් කළ යුතුය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු නිවේදනයේ 03, 04 ඡේදයන්හි සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනය වන 2017.03.02 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

4. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.03.02 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි අයෙක් විය යුතුය. ඒ අනුව 1999.03.02 දිනට හෝ ඊට පෙර හා 1972.03.02 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. (දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයට උපරිම වයස අදාළ නොවේ.)

5. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක PL -3-2016 වැටුප් කාණ්ඩය වේ. මෙම වැටුප් පරිමාණය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II ප්‍රකාරව ගෙවීම් සිදු කරනු ලබන අතර, ඒ අනුව

2017 වසරට නියමිත වැටුප : මූලික වැටුප : රු. 15,134

ගැලපීමේ දීමනාව : රු. 9,957

6. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වා එම පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට පුරප්පාඩු පිරවීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන පරීක්ෂණ දෙක සඳහාම ලබන ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

6.1 ලිඛිත පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණය සමත් වීම සඳහා අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබිය යුතු අතර, මෙම පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් අංක 1 හි සඳහන් විභාග මධ්‍යස්ථාන වලදී පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| මෝටර් රථ ආඥා පනත සහ මාර්ග නීති | පැය 02 | 100 | 40 |

(විෂය නිර්දේශය)

(i) මෝටර් රථ වාහන පනත යටතේ රියැදුරන් සතු වගකීම් ආදායම් බලපත්‍ර, රථවාහන ලියාපදිංචිය, රක්ෂණය සහ පැවරීම

(ii) මහා මාර්ග නීති, මාර්ග සංඥ

(iii) රථ වාහන පොලිසිය සතු වගකීම්

6.2 ප්‍රායෝගික පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නන්ගේ කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් තැපැල්පති විසින් නම් කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායකයන් උපයෝගි කර ගනු ලබන අතර, දක්වා ඇති පරිදි ලකුණු ලබා ගත යුතුය.

| | | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| (i) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව | 50 | 20 |
| (ii) | මෝටර් රථ ආඥා පනත සහ මාර්ග නීති | 50 | 20 |

7. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති සහ කොන්දේසි :

7.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

7.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත් වනු ඇත.

7.3 තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු අතර, පත්වීම් ලැබ වසර 05ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

7.4 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියැදුරු තනතුරේ රාජකාරි ඉටු කළ යුතුය. ස්ථාන මාරුවීම් වලට හිමිකම් පවතී.

8. අයදුම්කිරීමේ ක්‍රමය ඃ

8.1 මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 (සෙ. මී. 21 x 30) ප්‍රමාණයේ කඩදසියේ අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 04 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, ඉතිරිය ඊළඟ පිටුවලටද, ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදළ තොරතුරු පැහැදිළිව ඇතුළත් කළ යුතුය. මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍ය වලින් පැවැත්වෙන බැවින් අයදුම්පත්‍රයේ අදළ භාෂා මාධ්‍යයේ කේත අංකය යෙදිය යුතු අතර, අයදුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යෙදිය යුතුය. අයදුම්පත් තැපැල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www. slpost.gov. lk මගින්ද ලබාගත හැකිය.

8.2 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.03.02 දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියැදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017'' යන්න සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.3 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

9. විභාග කොන්දේසි ඃ

9.1 නියමිත වයස් සීමාවට අයත් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා 2017.03.02 දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

9.2 මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රුපියල් 500 ක මුදලක් ගෙවිය යුතුය. එම ගාස්තුව විභාග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003 - 02- 13 යටතේ රජයේ ආදයමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද විභාග කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි එක් දරයකින් ඇලවිය යුතුය. විභාග ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය අයදුම්කරුගේ නමින්ම නිකුත් කර තිබිය යුතුය. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාස්සි සහිත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින්

තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

9.3 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ විභාග කුවිතාන්සිය සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන සේ අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදයි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද විභාග කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.4 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

9.5 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

9.6 විභාග ප්‍රතිඵල :

ලිඛිත පරීක්ෂණයෙන් ලකුණු 40%ට නොඅඩුව ලැබූ අපේක්ෂකයින්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් නිවේදනයේ 6.2 ඡේදය අනුව ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ඇත. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව සකසන ලද ප්‍රතිඵල ලේඛනය තැපැල්පතිතුමා වෙත ලබා දෙනු ඇත. අනතුරුව ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පෞද්ගලිකව තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

10. විභාගයට පෙනී සිටීම :

10.1 විභාගය සඳහා පෙනී සිටින දින විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

10.2 විභාග ශාලාව තුළදී විභාග අපේක්ෂකයින් ශාලාධිපති වෙත තම අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය යන ලේඛනවලින් පමණක් ඕනෑම එකක් ඉදිරිපත් කළ යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවකදී සිංහල භාෂා මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධව අවසාන තීරණයක් ගැනීම තැපැල්පති සතු වන්නේය.

තැපැල්පති,
තැපැල් දෙපාර්තමේන්තුව.

2017 පෙබරවාරි මස 03 දින,
අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත්‍රය

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ
තැපැල් රියැදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017
Open Competitive Examination For Recruitment to the Post of Postal Service Driver
Grade 111 in the Employee Category of Primary Level Skilled
of the Department of Posts - 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| විභාගයට පෙනී සිටින නගරය | | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

1. (i) අගට යෙදෙන නම මුලින් යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
උදා :- GUNAWARDHANA M. G. B. S. K.

(ii) සම්පූර්ණ නම :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
සිංහලෙන්/දෙමළෙන් :————.

2. (i) ස්ථිර ලිපිනය :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට එවනු ලැබේ.
සිංහලෙන්/දෙමළෙන් :————.

3. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

(ii) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(iii) 2017.03.02 දිනට වයස : අවුරුදු මාස දින

4. (i) දුරකථන අංකය :

5. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? ඔව් නැත

(සුදුසු තැන (X) කතිර සළකුණ යොදන්න)

6. අධ්‍යාපන සුදුසුකම් :

6.1 අ. පො. ස. (සා. පෙළ) - පළමු වර

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2 අ. පො. ස. (සා. පෙළ) - දෙවැනි වර :

වර්ෂය :——————. විභාග අංකය :——————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7. කායික සුදුසුකම් :-
 අයදුම්කරුගේ උස : අඩි :—————. අඟල් :—————. (සෙ. මී. ..............)

8. වෘත්තීය සුදුසුකම් :
 (i) රියැදුරු බලපත්‍ර අංකය :—————.
 (ii) පන්තිය :—————.
 (iii) නිකුත් කළ දිනය :—————.
 (iv) D පන්තියේ (බර වාහන) රියැදුරු බලපත්‍රය ලබාගත් දිනය :—————.

9. වෙනත් සුදුසුකම් :—————.

10. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ X ලකුණ යොදන්න.)

ඔව් නම්, ඒ සම්බන්ධ තොරතුරු සඳහන් කරන්න. :—————.

11. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
 විභාග කුවිතාන්සි අංකය :—————.
 කුවිතාන්සිය නිකුත් කළ දිනය :—————.

*විභාග කුවිතාන්සිය නොගැළවෙන සේ මෙහි අලවන්න.*
*(විභාග කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

12. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සඳහන් කරමි. මෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙරාතුව සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වරද අනාවරණය වූයේ නම් වන්දියක් නොමැතිව වහාම මා සේවයෙන් පහ කළ හැකි බවත්, මම හොඳාකාරව දනිමි.

තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බවද, මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................ මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා එම විභාග කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අලවා ඇති බව ද සහතික කරමි.

——————,
අත්සන සහතික කරන්නාගේ අත්සන.

දිනය :——————.

අත්සන සහතික කරන අයගේ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.

නිල මුද්‍රාව :——————.

14. ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................... මහතා මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/ ආයතනයේ ............ දින සිට ............ තනතුරක සේවය කරන බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු මෙතෙක් මොනයම් හෝ ආකාරයක විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.

නිල මුද්‍රාව :——————.

02-212

---

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT - 01-2016) තාක්ෂණ සහායක තනතුර සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2017

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT - 01-2016) තාක්ෂණ සහායක තනතුරු 04 ක් සඳහා විවෘත ධාරාව යටතේ බඳවාගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී /පුරුෂ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 බඳවා ගැනීමේ ක්‍රමය :

විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයන් මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

| | |
|---|---|
| 01. | නිශ්චල ඡායාරූපකරණය |
| 02. | වීඩියෝ කැමරාකරණය |
| 03. | සංස්කරණය |
| 04. | ශබ්ද කාර්මික තාක්ෂණය |
| 05. | වාහන නඩත්තුව |
| 06. | විදුලි උපකරණ නඩත්තුව |
| 07. | ගොඩනැගිලි නඩත්තුව |

02. තනතුරෙහි ස්වභාවය : ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

03. වැටුප් කේත අංකය : MT - 01-2016
වැටුප් පරිමාණය : රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 48,890 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව)

04. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

| තනතුර | තාක්ෂණ සහායක |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් වීම. |
| වෘත්තීය සුදුසුකම් | එක්, එක් ක්ෂේත්‍රයේ කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.<br><br>ක්ෂේත්‍ර යන්නට රජයේ චිත්‍රපට අංශයේ නිශ්චල ඡායාරූපකරණය, වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, ශබ්ද කාර්මික තාක්ෂණය, මෝටර් වාහන නඩත්තුව, විදුලි උපකරණ නඩත්තුව හා ගොඩනැගිලි නඩත්තුව ඇතුළත් වේ. |

05. කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

06. වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

07. වයස :- අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

08. බඳවා ගැනීමේ ලිඛිත විභාගය :-

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් කොළඹ නගරයේ දී පමණක් පැවැත්වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ පරීක්ෂණය | තනතුරුවලට අදාළව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විතය. | පැය 01 | 100 | 40 |

09. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

10. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

11. මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පතට අනුව 1 සිට 05 දක්වා පළමු පිටුවට ද, අනෙක් කොටස් දෙවන හා තුන්වන පිටුවට ද ඇතුළත් වන සේ A4 ප්‍රමාණයේ කොළයක දෙපසම භාවිතයට ගනිමින් අයදුම්පත්‍රය සැකසිය යුතු ය. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත් සකස් කළ යුතුය. මෙම නිවේදනයේ නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

13. සුදුසුකම් ලැබූවන් විභාගයට කැඳවනු ලබන අතර, ඒ බව සති දෙකකට ප්‍රථම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. :-

I. තැපෑලෙන් නැතිවීම හෝ සිදු වූ ප්‍රමාද, සඳහා වන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ,
II. ''රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05'' යන ලිපිනයට හැර වෙනත් ලිපිනයකට එවනු ලබන අයදුම්පත්‍ර සඳහා වන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ,
III. රජයේ සේවයේ සිටින අය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. තෝරාගනු ලබන විට දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට එකඟ බව සඳහන් කළ යුතුයි,
IV ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත,
V විභාගයට ප්‍රවේශපත්‍ර එවීම ඔබගේ සුදුසුකම් සනාථ කළ බවට සැලකිල්ලට නොගත යුතු ය.

14. මෙම විභාගයට පෙනී සිටීමට දින 07කට ප්‍රථමයෙන් ප්‍රවේශපත්‍ර නොලැබී තිබේ නම් පහත සඳහන් විස්තරවලට අනුව ''රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05'' ලිපිනයට දැන්විය යුතු ය. (දුරකථන අංකය : 011-2514266, ෆැක්ස් අංකය : 011-2514092) :

- ඉල්ලුම් කිරීමේ ලිපිය,
- විභාගයේ නම,

- අයදුම්කරුගේ සම්පූර්ණ නම,
- ජාතික හැඳුනුම්පත් අංකය,
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය,
- අයදුම්පතේ ඡායා පිටපත,
- ඉල්ලුම්පත් තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලියාපදිංචි අංකය හා දිනය,
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් එහි ඡායා පිටපත,
- ප්‍රවේශපත් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය.

15. *අයදුම් කළ යුතු ක්‍රමය* :-

(*අ*) අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''තාක්ෂණ සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 යනුවෙන් සඳහන් කර 2017/03/03 වැනි දිනට පෙර ''රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017/03/03 වේ.

(*ඇ*) ''රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05'', යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු.1000.00 ක විභාග ගාස්තුවක් සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුයි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

16. *අත්සන සහතික කිරීම* :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ/ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

*සැලකිය යුතුයි* -

- අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳව සහතික විය යුතුයි.

- සුදුසුකම්වලට අදාළ සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුයි.

- ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා රජයේ සේවකයන්ට අදාළ වන සියළුම නීති රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්ට, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තාමේන්තුව මගින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

- පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ කිරීමේ සම්පූර්ණ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

- තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ආචාර්ය රංග කලන්සූරිය,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2017 ජනවාරි මස 13 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත, කොළඹ දීය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT - 01-2016) තනතුර සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2017

ඉල්ලුම් කරන අංශය : [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 01
දෙමළ - 02 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./ Mrs./Miss. :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Mr./ Mrs./Miss. SILVA A.B

1.2 සම්පූර්ණ නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :——————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ලිපිනය (පෞද්ගලික) :——————.
(සිංහලෙන්/ දෙමලෙන්)

03. 3.1 උපන් දිනය :——————.

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස :

අවු : [ | ] මාස [ | ] දින [ | ]

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

05. ස්ත්‍රී/ පුරුෂභාවය :——————.

06. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :——————. විභාග අංකය :——————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

(ආ) වෘත්තීය සුදුසුකම් :——————.

(ඇ) වෙනත් සුදුසුකම් :——————.

07. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :——————.
(ii) ලදුපත් අංකය හා දිනය :——————.
(iii) ගෙවූ මුදල :——————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. රු.1000.00 |
|---|

08. *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
නිල මුද්‍රාව :——————.

02-87

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

(*අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.*)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **පෙබරවාරි** | 2017.02.03 | සිකුරාදා | 2017.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.09 | බ්‍රහස්පතින්දා | 2017.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.17 | සිකුරාදා | 2017.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.23 | බ්‍රහස්පතින්දා | 2017.02.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2017.03.03 | සිකුරාදා | 2017.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.10 | සිකුරාදා | 2017.02.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.03.17 | සිකුරාදා | 2017.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.24 | සිකුරාදා | 2017.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.31 | සිකුරාදා | 2017.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2017.04.07 | සිකුරාදා | 2017.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.12 | බදාදා | 2017.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.21 | සිකුරාදා | 2017.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.28 | සිකුරාදා | 2017.04.12 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.